www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නේපාල මාඕවාදියෝ සන්නද්ධ අරගලය අතහැර දමා ආන්ඩුවට එක් වීමට එකග වෙති

## Nepalese Maoists agree to abandon armed struggle and join government

**දීපාල් ජයසේකර විසිනි**
**2006 ජුලි 04**

අප්‍රේල් මස අග දි ගයනේන්ද්‍ර රජුට පසු බැසීමට බල කල තිරසර මහජන විරෝධතාවලින් ඉක්බිතිව, ජූනි 16 දා, නේපාල මාඕවාදී කොමියුනිස්ට් පක්ෂය -- සීපීඑන්(එම්) -- දැන් අගමැති ගිරිජා ප්‍රසාද් කොයිරාල විසින් නායකත්වය දෙනු ලබන අන්තර්-වාර ආන්ඩුවට ඇතුලු වීම පිලිබඳ ගිවිසුමකට එකඟ විය. මෙම තීන්දුව, සිය මිලිටරි නිල ඇඳුම් හා ස්වයංක්‍රීය රයිෆල්, ව්‍යාපාරික ඇඳුම් කට්ටල හා පාර්ලිමේන්තු ආසන වෙනුවෙන් මාරු කර ගන්නා දීර්ඝ ගරිල්ලා සංවිධාන පෝලිමේ නවතම සාමාජිකයන් වීමට යන නේපාල මාඕවාදීන්ගේ දේශපාලන බංකොලොත් භාවය ද නේපාලයේ ධනේශ්වර පාලනයේ අර්බුදයේ ගැඹුර ද යන දෙකෙහි ම ප්‍රකාශනයකි.

කත්මන්ඩු නුවර පැවති හමුවක දී, කොයිරාල, ප්‍රචන්ඩ යන නමින් වඩා ප්‍රසිද්ධ, මාඕවාදී නායක පුෂ්ප කමල් දාල් සමග කරුනු අටකින් යුත් ගිවිසුම අත්සන් කලේ ය. එම සැලසුම යටතේ, සීපීඑන් (එම්) ඇතුලත් වන හා දැනට කෙටුම්පත් කෙරෙමින් පවත්නා අන්තර්-වාර ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වනු ඇති අන්තර්-වාර පාලනයකට ඉඩ දෙමින් වත්මන් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ඇත. ලබන වසරේ මැයි වන විට, "ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක්"- සඳහා මැතිවරනයක් පැවැත්වේ. එම මන්ඩලය නව නිත්‍ය ව්‍යවස්ථාවක් ස්ථාපිත කරනු ඇත.

මාඕවාදී නායක ප්‍රචන්ඩ, මාධ්‍යවලට අදහස් දක්වමින්," රට නව දිශාවකට යොමු කරන" "ඓතිහාසික තීන්දුවක්" ලෙස ගිවිසුම වග වර්නනා කලේ ය. 1996 සිට දරුනු ගරිල්ලා යුද්ධයක් ගෙන යමින් සිටින සීපීඑන් (එම්), නේපාලයේ ග්‍රාමීය ප්‍රදේශවලින් සැලකිය යුතු කොටසක් පාලනය කරන ඔවුන්ගේ "මහජන ආන්ඩු" විසුරුවා හැරීමටත් අවසානයේ සිය ගරිල්ලා සටන්කරුවන් රටේ මිලිටරිය සමග ඒකාග්‍ර කිරීමටත් එකඟ වී තිබේ.

කොයිරාල හා ඔහුගේ පක්ෂ හතේ සභාගය සම්බන්ධයෙන් ගත් කල, මාඕවාදීන්ගේ සහයෝගය තීරනාත්මක ය. විපාර්ශ්වික පක්ෂ නාමිකව විරෝධතා ව්‍යාපාරයේ නායකත්වයේ සිටි නමුදු, එයට සහභාගි වූ බොහෝ අය, 1990 ගනන්වල කුප්‍රකට ලෙස දූෂිත හා අස්ථාවර ආන්ඩු මතකයට නගා ගනිමින්, එම පක්ෂ නායකයන් සම්බන්ධයෙන් ගත්තේ සැක සංකා සහිත ආකල්පයකි. 2002 දී පාර්ලිමේන්තුව අත්හිටවූ ගයනේන්ද්‍ර රජුගේ අත්තනෝමතික පාලනයට වෛර කල අතර ම, විරෝධතාකරුවන්ට, ධනේශ්වර නේපාල කොංග්‍රසයේ ප්‍රධානියා වන කොයිරාල හෝ ඔහුගේ වාම සගයන් වන එක්සත් මාක්ස්වාදී ලෙනින්වාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය (සීපීඑන්-යූඑම්එල්) හා එක්සත් වාමාංශික පෙරමුන පිලිබඳ එතරම් විශ්වාසයක් තිබුනේ ද නැත.

මාඕවාදීන් ආන්ඩුවට ගෙන ඒම මගින්, කොයිරාල රටේ සිවිල් යුද්ධය තාවකාලිකව යටපත් කොට අන්තර්-වාර ආන්ඩුවේ විශ්වාසනීයත්වයට වාරුවක් ලබා ගෙන ඇත. ඔහුගේ ස්වදේශීය ඇමති ක්‍රිෂ්න ප්‍රසාද් සිතුවාලා මෙසේ ප්‍රකාශ කලේ යඃ "රට වත්මන් අර්බුදයෙන් ගොඩ ගනු වස් අපි කරුනු අටකින් යුත් අවබෝධතාවකට අවතීර්න වී ඇත්තෙමු." වඩා දුර දිග යන ප්‍රජාතන්ත්‍ර හා සමාජ පියවර පිලිබඳ මහජන ඉල්ලීම්, විශේෂයෙන් ම විරෝධතා ව්‍යාපාරයට කේන්ද්‍ර වූ තරුන ජනයා වෙතින් මතු වන ඉල්ලීම්, යටපත් කරනු වස්, ආන්ඩුව මාඕවාදීන් මත වාරු වීමට යයි.

ඔවුන්ගේ සියලු රැඩිකල් පූච්චානම් තිබිය දී ම, මාඕවාදීන්ගේ ප්‍රධාන ඉල්ලීම රජාන්ඩුව අහෝසි කිරීම මිස ධනවාදය අහෝසි කිරීම නොවන බව, කෘතහස්ත ධනේශ්වර දේශපාලනඥයකු ලෙස, කොයිරාල හොඳින් දනී. පක්ෂය පදනම් වන්නේ, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩුවක්, සමාජවාදී ඉල්ලීම් ඈත අනාගතයට කල් තබන, අත්‍යවශ්‍ය ප්‍රථම අවිධියක් ලෙස අවධාරනය කරන, ස්ටැලින්වාදී අවධි දෙකේ න්‍යාය මත ය. රජාන්ඩුවේ හා මිලිටරියේ බලය අහෝසි කරනවා වෙනුවට, මාඕවාදියෝ මෙම ප්‍රතිගාමී බලවේගයන්ට යලි කාන්ඩ ගැසීමේ අවස්ථාව ලබා දෙති.

පසු බැසීමට රජු ගත් තීන්දුවෙන් පසුව කැපී පෙනෙන නිශ්ශබ්දතාවකින් සිටි නේපාල හමුදාව, ජූනි 20 දා නිවේදනයක් නිකුත් කරමින්, හමුදාව "මිනිසුන් ඝාතනය කිරීමට හා නේපාල කාන්තාවන් දූෂනය

කිරීමට" මිස අන් කිසිදු කර්තව්‍යයකට නුසුදුසු බවට ප්‍රචන්ඩ කල ප්‍රකාශයකට විරුද්ධත්වය පල කිරීම අර්ථභාරී ය. තමන් තව දුරටත් "පවත්නා ව්‍යවස්ථාමය ආන්ඩුවේ ඍජු ආඥාව යටතේ රටේ ස්වෛරී භාවය, භෞමික අඛන්ඩතාව සහ මහජනතාවගේ ආත්ම ගෞරවය ආරක්ෂා කිරීමට කැප වන්" බව එය ප්‍රකාශ කලේ ය. එදින ම, හමුදා මූලස්ථානය රයිෆල්, වෙඩි උන්ඩ, පුපුරන ද්‍රව්‍ය, උපාංග හා අමතර කොටස්, සන්නද්ධ රථ, ටැංකි, හෙලිකොප්ටර් සහ ප්‍රහාරන ගුවන් යානා ඇතුලු තමන් මිල දී ගැනීමට යන දීර්ඝ නව අවි ආයුධ ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කලේ ය.

ස්වකීය පරිපාලන ඒකක විසුරුවා හැරීමට හිලව් වසයෙන් මාඕවාදීන්ට ලැබී ඇත්තේ සොච්චමකි. මාඕවාදීන්ට ඇමති තනතුරු ලබා දෙනවාට අමතරව, කොයිරාල ආන්ඩුව මැයි මස දී 350ක් පමන වන මාඕවාදී දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම ඇරඹූ අතර ජූනි 12 දා රටේ ත්‍රස්ත-විරෝධී නීතිය යටතේ රඳවා සිටින එම සිරකරුවන්ට එරෙහිව අලුතින් චෝදනා ගොනු නොකරන බවට ද එකඟ විය. ව්‍යවස්ථා සම්පාදක මන්ඩලය තුල ආසන සඳහා තරග වැදීමේ අවස්ථාව ද මාඕවාදීන්ට ලැබෙනු ඇත.

වඩාත් ම සංවේදී ගැටලුව නම් සීපීඑන්(එම්) ගරිල්ලා සටන්කරුවන් නිරායුධ කිරීම යි. කොයිරාල හා ප්‍රචන්ඩ විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශයට අනුව, "දෙපාර්ශ්වයේ ම ආයුධ කලමනාකරනයට හා නිරීක්ෂනයට සහාය වීම" සහ ව්‍යවස්ථා සම්පාදක මන්ඩලය සඳහා පැවැත්වෙන මැතිවරනය නිරීක්ෂනය කිරීම පිනිස එක්සත් ජාතීන්ගේ සංවිධානයට ආරාධනා කිරීමට දෙපාර්ශ්වය එකඟ වී තිබේ. විපාර්ශ්වික පක්ෂ හත සමග පසු ගිය නොවැම්බරයේ ඇති කර ගත් ගිවිසුමකට අනුව, මාඕවාදියෝ අවසානයේ නිරායුධ වීමට එකඟ වූහ.

නව අන්තර්-වාර ආන්ඩුවක් තැනූ වහාම සිය ගරිල්ලා හමුදාවේ පරම අන දෙන නිලධාරි තනතුරෙන් තමන් ඉවත් වන බව, පසු ගිය සතියේ රජයේ රූපවාහිනිය සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී ප්‍රචන්ඩ ප්‍රකාශ කලේ ය. "අපගේ හමුදාව නව අගමැති යටතට පත් කිරීමට අප සූදානම් ය. එවිට ගරිල්ලා හමුදාව ජාතික හමුදාව බවට පත් වනු ඇති අතර එය තව දුරටත් මාඕවාදී හමුදාව නොවනු ඇත" යැයි ඔහු පැවසී ය. කෙසේ වෙතත්. ඒ සම්බන්ධයෙන් කිසිදු යාන්ත්‍රනයක් ප්‍රකාශයට පත් කොට නැත.

සීපීඑන්(එම්) සාමයට කැප වී ඇතැයි යන්න ප්‍රකාශ කිරීමෙහි ලා ප්‍රචන්ඩ බොහෝ සෙයින් වෙහෙස මහන්සි වී ඇත. "අප යලි යුද්ධයට යන්නේ නැත." යැයි ඔහු පසු ගිය සතියේ ඒඑෆ්පී ප්‍රවෘත්ති සේවයට පැවසී ය. මැයි මස සටන් විරාමය ඇරඹුනාට පසුව සිය සටන්කරුවන් පුද්ගලයන් නව දෙනෙකු මරා දමා ඇති බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය කරන චෝදනාව ඔහු ප්‍රතික්ෂේප කලේ ය. මාඕවාදී නායකයා අවධාරනය කලේ, එවන් එක ඝාතනයක් පමනක් සිදු වී ඇති අතර එය සිදු කල තැනැත්තාට ප්‍රසිද්ධියේ දඬුවම් දුන් බව යි.

මාඕවාදීන් රජාන්ඩු ක්‍රමය සම්පූර්නයෙන් ම අහෝසි කරන ලෙස ඉල්ලා සිටියත් දෙපාර්ශ්වය සමූහාන්ඩු ව්‍යවස්ථාවකට එකඟ වූ බවක් කරුනු අටේ ගිවිසුමේ සඳහන් නොවේ. ගයනේන්ද්‍ර රජුගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් පැන නැගි මහජන වෛරය යටපත් කිරීමේ ප්‍රයත්නයක් ලෙස, හමුදාව මත පවත්නා පාලනය, නෛතික මුක්තිය, බදුවලින් නිදහස් වීම හා නව නීති සම්බන්ධයෙන් පවත්නා නිෂේධ බලය ඇතුලු රජුට පෙර පැවති බලතල හා වරප්‍රසාද අහිමි කිරීමට නේපාල ආන්ඩුවට බල කෙරුනි. කෙසේ වෙතත්, රාජ්‍ය යන්ත්‍රයේ තීරනාත්මක කඩ ඇනයක් ලෙස පවතින රජාන්ඩුව අහෝසි කිරීමට ආන්ඩුව පියවර ගත්තේ නැත.

තමන්ට අවශ්‍ය වන්නේ චාරිත්‍රානුකූල තනතුරක් ලෙස රජු ද අන්තර්ගත කර ගත් ව්‍යවස්ථාමය රජාන්ඩුවක් ස්ථාපිත කිරීම ය යන්න කොයිරාල දැනටමත් අඟවා ඇත. ජූනි 14 දා විරාට්නගර්හි පැවති ස්වකීය නේපාල කොංග්‍රස් පක්ෂයේ හමුවක් අමතමින් ඔහු මෙසේ අනතුරු ඇඟවී යඃ "රජුට පැවතීමේ අවකාශයක් නොදුන හොත් එය භයානක තත්වයක් නිර්මානය කල හැකි ය."

කොයිරාලගේ ප්‍රකාශය ශිෂ්‍යයන්ගේ විරෝධතා ඇවිලීමට වහාම තුඩු දුනි. ජූනි 16 දා ශිෂ්‍යයෝ, රජාන්ඩුව දිගටම තබා ගැනීම පිලිබඳ කොයිරාලගේ යෝජනාවට විරෝධය පල කරනු පිනිස, රජාන්ඩුව හෙලා දකින ධජ ඔසවා ගෙන රජුගේ පඹයන් පුලුස්සමින්, කත්මන්ඩු නුවර විශ්වවිද්‍යාල දෙකකට කඩා වැදුනි. සීපීඑන්(එම්) ගිනිකොනදිග නේපාලයේ රැලියක් හා වීදි රැස්වීම් පැවැත්වූ අතර පක්ෂයේ සාම ලේකම් කාර්යාලය කොයිරාලගේ ප්‍රකාශය "වගකීම් විරහිත" යැයි විවේචනය කරමින් නිවේදනයක් නිකුත් කලේ ය. කෙසේ වෙතත්, නව ව්‍යවස්ථාවක් සඳහා පවත්නා ජන මත විචාරනයේ දී රජාන්ඩුව දිගට ම පවත්වා ගෙන යාමට එකඟ වන ප්‍රතිඵලයක් ලැබුන හොත් තම පක්ෂය එය පිලිගන්නා බව ප්‍රචන්ඩ දැනටමත් අඟවා ඇත.

## මාඕවාදී කැරැල්ලේ ප්‍රභවය

සීපීඑන්(එම්) සංවිධානයේ ප්‍රභවය පවතින්නේ, කලින් අත්තනෝමතික පාලනයක් ගෙන ගොස් තිබූ එකල සිටි රජුට, සීමිත සහන දීමට බල කෙරුනු, 1990 මහජන විරෝධතා ව්‍යාපාරය තුල ය. විරෝධතා ව්‍යාපාරයේ කොටස්, රජු අත බොහෝ බලතල තබා ගත් ව්‍යවස්ථාවකට එකඟ වීමට ප්‍රධාන පක්ෂ ගත්

තීන්දුවට සතුරු වූ අතර, 1991 දී ප්‍රථම අගමැති ලෙස තේරී පත් වූ කොයිරාල සම්බන්ධයෙන් විවෘතව ම අවඥා සහගත වූහ.

මොහාන් බික්‍රම් විසින් අරඹන ලද මාඕවාදී ප්‍රවනතාවක් ස්ටැලින්වාදී නේපාල කොමියුනිස්ට් පක්ෂයෙන් (සීපීඑන්) භේද විය. නිර්මාල් ලාමා එක්සත් මහජන පෙරමුන (යූපීඑෆ්) පිහිටු වූ අතර එය 1991 මැතිවරනය තරඟ කොට ආසන 9ක් දිනා ගති. ඒ අතර ප්‍රචන්ඩ ද විය. තුන් වසරක් ඇවෑමෙන් 1994 මැයි මස, ප්‍රචන්ඩ වටා වූ කන්ඩායමක් යූපීඑෆ් වෙතින් භේද වී 1995 මාර්තුවේ දී මාඕවාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය ලෙස තමන් යලි නම් කර ගත්තේ ය. එම සංවිධානය 1996 පෙබරවාරියේ දී රජාන්ඩුවට එරෙහිව “සන්නද්ධ අරගලය” දියත් කලේ ය. එහි දෘෂ්ඨිවාදය පදනම් වූයේ මාඕවාදයේ ද ස්වෝත්තමවාදී ලෙස ඉන්දියාව හෙලා දැකීම සමග කැලතුනු නේපාල ජාතිකවාදයේ ද සාරසංග්‍රහවාදී මිශ්‍රනයක් මත ය.

මාඕවාදියෝ, නේපාල හමුදාවට එරෙහි ලේ වැකි යුද්ධයක් සඳහා තරුනයන් බඳවා ගනිමින්, දරිද්‍රතාවට පත් ගම්බද ප්‍රදේශ තුල අනුගාමිකත්වයක් දිනා ගැනීමට සමත් වූ අතර එම යුද්ධය ජීවිත 13,000ක් පමන බිලි ගත්ට ඇතැයි තක්සේරු කෙරේ. සිය බලය පවත්වා ගෙන යනු පිනිස, අතිශයින් ම කෲර විධික්‍රම යොදා ගැනීමට සීපීඑන්(එම්) පැකිලුනේ නැත. කෙසේ වෙතත්, පක්ෂය, කත්මන්ඩු වැනි ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන තුල මොන යම් හෝ සැලකිය යුතු සහයෝගී පදනමක් දිනා ගැනීමට සමත් නොවුනු අතර, රජුට එරෙහිව මේ වසරේ පැන නැගි මහජන විරෝධතා ක්‍රියාදාමය තුල දී තථ්‍ය ලෙස ම පසෙකට වී බලා සිටියේ ය.

ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට යලි පැමිනීමේ විධික්‍රමයක් සෙවීමෙහි ලා සීපීඑන්(එම්) වඩා වඩා යෙදී ගෙන ඇත. බුෂ් පාලනාධිකාරය සිය “ත්‍රස්ත විරෝධී යුද්ධය” ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව උත්සන්න කෙරුනු පීඩනයට නේපාල මාඕවාදීන් ඔවුන්ගේ ත්‍රස්තවාදී සංවිධාන ලැයිස්තුවට එකතු කිරීම ඇතුලත් වූ අතර නේපාල හමුදාවට අවි ආයුධ හා සහයෝගය සැපයීම ද ආරම්භ කෙරුනි. ඉන්දියානු ආන්ඩුවේ වක්‍ර සහයෝගය යටතේ, ප්‍රචන්ඩ සහ සෙසු මාඕවාදී නායකයෝ පසු ගිය නොවැම්බරයේ දී නව දිල්ලියට ගොස් ගයනේන්ද්‍ර රජුට එරෙහි ඒකාබද්ධ අරගලයක් සඳහා විපාර්ශ්වික පක්ෂ හතේ සන්ධානය සමග ගිවිසුමකට එලඹුනහ.

ඉන්දියානු ආන්ඩුවට එවන් ගිවිසුමක් තුල නිශ්චිත නිහිත ස්වාර්ථයන් පැවතුනි. නේපාලය තුල ඉන්දියානු ආනුභාවය පවත්වා ගෙන යාම මෙන් ම, ගිවිසුම, ඉන්දියාව තුල ගොවි ජන ගරිල්ලා ප්‍රවනතාවන්ට ද එම මාවත ම ගන්නා ලෙස දිරිගැන්වීමෙහි ලා ප්‍රයෝජනවත් පූර්වාදර්ශයක් සැපයී ය. දශක එකහමාරක් තිස්සේ ඉන්දියාව තුල ක්‍රියාවට දමා ඇති වෙලඳ පොල ප්‍රතිසංස්කරන, සමාජ භේදයන් ගැඹුරු කොට රටේ දශ ලක්ෂ සංඛ්‍යාත ග්‍රාමීය දුගීන් අතර අසහනය වර්ධනය වීමට තුඩු දී ඇත.

ගයනේන්ද්‍ර රජුට පසු බැසීමට බල කිරීමෙහි ලා ඉන්දියාවේ හස්තය ද ක්‍රියාත්මක විය. අප්‍රේල් අග පැවති විශේෂ කැබිනට් රැස්වීමකින් පසුව, ඉන්දියානු අගමැති මන්මෝහන් සිං, සිය බලතල අතහැර පාර්ලිමේන්තුව යලි පිහිටුවන ලෙස රජුට “බලගතු පනිවිඩයක්” දෙනු පිනිස තම විශේෂ නියෝජිත කරන් සිං කත්මන්ඩු නුවරට එවී ය. මාඕවාදීන් සමග මැත ම ගිවිසුම ඇති කර ගත්තේ, සිං සහ සෙසු නායකයන් සමග සාකච්ඡා කරනු පිනිස කොයිරාල ඉන්දියාවට කල දින හතරක සංචාරයකින් පසුව ය. නව දිල්ලිය, එ.ජ. ඩොලර් මිලියන 218ක ආර්ථික ආධාර පැකේජයක් පොරොන්දු වෙමින්, සීපීඑන්(එම්) සමග අන්තර්-වාර ආන්ඩුවක් පිලිබඳ යෝජනාවට සිය ආශිර්වාදය පැහැදිලිව ම ලබා දුන්නේ ය.

කෙසේ වෙතත්, ඉන්දියානු ආන්ඩුව පැහැදිලි කලේ, මාඕවාදීන් සිය සන්නද්ධ අරගලය නිසැකව ම අතහැර දමා පාර්ලිමේන්තු කරලිය තුල ස්ථානයක් භාර ගත යුතු බව යි. කොයිරාලගේ සංචාරය තුල දී, ඉන්දියානු විදේශ අමාත්‍යංශයේ ප්‍රකාශකයෙක් මාධ්‍යවලට මෙසේ පැවසී යː “අපි සාම ප්‍රයත්නයට සහාය දෙන්නෙමු. එහෙත් මාඕවාදීන් ප්‍රචන්ඩත්වය අතහැර බහු පාක්ෂික ප්‍රජාතන්ත්‍රවාදයේ විනය පිලිගත යුතු ය.” ඉන්දියාවේ ජාතික ආරක්ෂක උපදේශක එම්.කේ. නාරායනන්, සීපීඑන්(එම්) නිරායුද කිරීමේ අවශ්‍යතාව කොයිරාල සමග මතු කල බව ද වාර්තා විය.

ආන්ඩුව තුලට මාඕවාදීන් මොන යම් ආකාරයකින් හෝ ඇතුලු කර ගැනීමකට කලින් විරුද්ධ වී සිටි බුෂ් පාලනාධිකාරය, ඊටත් වඩා තියුනු වී තිබේ. එක්සත් ජනපද තානාපති ජේම්ස් මොරියාටි පසු ගිය සතියේ කත්මන්ඩු නුවර පැවති ප්‍රසිද්ධ උත්සවයක දී කියා සිටියේ, වොෂිංටනය තව මත් සීපීඑන්(එම්) ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස සලකන බව යි. “මාඕවාදීන්ට හෝ ඔවුන් ඇතුලත් ආන්ඩුවකට මොන යම් ආකාරයකින් හෝ අප උදව් උපකාර කිරීමට පෙර ඔවුන් සිය ක්‍රියාකලාපය වෙනස් කර ගත යුතු ය.” යැයි ඔහු පැවසී ය. එක්සත් ජනපදය නේපාලයේ විශාලතම ආධාර ප්‍රතිපාදකයන්ගෙන් එක් අයෙකි.

මාඕවාදීන් සිය අතීත අධිරාජ්‍ය විරෝධී පූච්චානම් විසි කර දැමීමට සූදානම් බවට දැනටමත් ඇඟවුම් පවතී. *ඒසියා ටයිම්ස් ඔන්ලයින්* සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී ජ්‍යෙෂ්ඨ සීපීඑන්(එම්) නායක දේව් ගුරුං කියා සිටියේ, ඉඩම් හා සෙසු දේපොලවල පුද්ගලික අයිතිය අහෝසි කිරීම සිය පක්ෂයේ පිලිවෙත බවට පවත්නා කටකතාවේ කිසිදු සත්‍යයක් නැති බව යි.

ජූනි 22 දා පල වූ බීබීසී වාර්තාවකට අනුව, ප්‍රචන්ඩ, ධනපති ලාභ ගැරීම ආර්ථික වර්ධනයට රුකුල් දෙන බව පවසමින් එම ලාභ ගැරීම අනුමත කරමින් කතා කලේ ය.

නේපාලය ලෝකයේ දුප්පත්ම රටවලින් එකකි. ජනගහනයෙන් සියයට 40ක් පමන දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත් වන බවට තක්සේරු කෙරේ. ආන්ඩුවේ ජාතික ජීවන මට්ටම් සමීක්ෂනයට අනුව, දශ ලක්ෂයකට අධික නේපාල ලමුන් ලමා ශ්‍රමිකයන් ලෙස කඹුරන අතර ඔවුන්ගෙන් 127,000ක් වඩාත් ම නරක ම සූරාකෑමේ කොන්දේසිවලට යටත් කෙරේ. සෞඛ්‍යය, අධ්‍යාපනය සහ සෙසු මූලික සේවාවන් රටේ බොහෝ කොටස්වල කිසිසේත් ම නොපවතින තරම් ය. මෙම භයංකර කොන්දේසි අහෝසි කරනවා වෙනුවට, නේපාලය "ලාභ ගැරීමට" විවෘත කිරීම සමාජ අර්බුදය තව දුරටත් උත්සන්න කරනු ඇත.

ආන්ඩුවට එකතු වීම මගින්, මාඕවාදීන් කරන්ට යන්නේ, ශිෂ්ඨ සම්පන්න ජීවන කොන්දේසි හා මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් ඉල්ලමින් වැඩ කරන ජනතාවගේ ස්ථර වෙතින් නොවැලැක්විය හැකි ලෙස ම මතු වනු ඇති විරුද්ධත්වය පාලනය කිරීම හා මැඩීම පිනිස පාලක පන්තියට සහයෝගය දීම යි.

© www.wsws.org